# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 142/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 26/01/2024<br>පැය 0545 |

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. තියුණු ආයුධ වලින් පහරදී මුදල් හා දේපල කොල්ලකෑමක් - පමුණුගම පොලිස් වසම.**

2024.01.25 වන දින අළුයම් කාලයේ පමුණුගම පොලිස් වසමේ දැලතුර ඇලබැම්ම ප්‍රදේශයේදී අන්තර් ජාලයේ පලකර තිබූ වෙළඳ දැන්වීමක් අනුව යතුරුපැදියක් මිලදී ගැනීමට ලොරි රථයකින් පැමිණි පුද්ගලයින් තිදෙනෙකුට මාර්ගයේ සැඟව සිටි පුද්ගලයින් සිව්දෙනෙකු විසින් තියුණු ආයුධ වලින් හා යකඩ පොල්ලකින් පහරදී රුපියල් 132,000/-ක මුදලක්, ජංගම දුරකථනය පහක්, ලොරි රථයේ ආයුධ කට්ටලය, රන්මාලයක් හා අත්පලදනාවක් කොල්ලකා පලායාමක් සම්බන්ධව පමුණුගම පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

පහරදීමෙන් තුවාල ලැබූ වයස අවුරුදු 29 ක් වන කිරිදිවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

තුවාලකරු රාගම රෝහලේ ප්‍රතිකාර ලබයි. මුදල් හා දේපල කොල්ලකන ලද සැකකරුවන් හඳුනාගෙන ඇති අතර අත්අඩංගුවට ගැනීම සඳහා පමුණුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. විදුලිබල මණ්ඩලයට අයත් විදුලි සන්නායක රැහැන් කපා අනර්ථයක් සිදුකිරීම – හෝමාගම පොලිස් ස්ථානය.**

2024.01.25 වන දින උදෑසන කාලයේ හෝමාගම පොලිස් වසමේ නියඳගල අධිවේගී ගුවන් පාලම යට රුපියල් 1,050,000/- ක අධිබලැති විදුලි සන්නායක රැහන් කපා අනර්ථයක් සිදුකර ඇති බවට හෝමාගම පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

අලුතින් කරගෙන යන අධිබලැති 33000W විදුලි මාර්ගය මාකුඹුරේ සිට දීපන්ගොඩ හංදිය දක්වා විදුලි මාර්ගය ඉදිකිරීමට කටයුතු කර ඇති අතර මාස 02 කට පමණ පෙර විදුලි සන්නායක රැහැන් ඇදගෙන යන අතර එය අවසන් අදියරේ පවතින බැවින් දැනට නවතා

ඇත. මාකුඹුරේ සිට දීපන්ගොඩ දක්වා දිවෙන විදුලි රැහැන් කපා රෝල් කර දමා ඇති බවත්, එම ස්ථානයට පැමිණිලිකරු යන විට තිදෙනෙකු පලාගොස් ඇත.

සිද්ධියට අදාල සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට හෝමාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. දියේ ගිලී මියයාමක් - කොස්ගොඩ පොලිස් වසම.

2024.01.25 වන දින දහවල් කාලයේ කොස්ගොඩ පොලිස් වසමේ කයිකාවල මුහුදු තීරයේ දිය නාමින් සිටි පුද්ගලයෙකු දියේ ගිලී අතුරුදහන්ව ඇති බවට කොස්ගොඩ පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර නාවික හමුදා කිමිදුම් නිලධාරීන්ගේ සහය ඇතිව මෙම පුද්ගලයා ගොඩගෙන බලපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට වෛද්‍යවරුන් විසින් දන්වා ඇත.

**මරණකරු වයස අවුරුදු 28 ක් වන වත්තේහේන, තල්ගස්වල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු ඔහුගේ පවුලේ අය හා ඥාතීන් කිහිපදෙනෙකු සමඟ වන්දනා ගමනක් සඳහා පැමිණ අනතුරුව කයිකාවල මුහුදු තීරයේ දිය නාමින් සිටින අවස්ථාවේ මෙම අනතුරට ලක්ව ඇත. මෘත ශරීරය බලපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කොස්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරගෙන යනු ලබයි.

## 04. දියේ ගිලී දරුවෙකු මියයාමක් - මහියංගණය පොලිස් වසම.

**2024.01.25 වන දින දහවල් කාලයේ මහියංගණය පොලිස් වසමේ යාය 01 ප්‍රදේශයේ ඇලක දිය නාමින් සිටි පිරිමි දරුවෙකු දියේ ගිලී මියගොස් ඇති බවට මහියංගණය පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.**

**මියගිය දරුවාගේ වයස අවුරුදු 06 ක් වන දික්යාය, අරාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

**මියගිය දරුවාගේ පියාගේ සහෝදරියගේ නිවසට පැමිණ සිටියදී, නිවස අසල ඇලක දියනෑමට ගොස් ඇති අතර දරුවා සැඩ පහරකට හසුව මීටර් 400 ක් පමණ දුරට ගසා ගෙන ගොස් දියේ ගිලී මියගොස් ඇති බවට පොලිසිය සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත.**

**මෘත ශරීරය ඌරණිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මහියංගණය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.**

## 05. දියේ ගිලී පුද්ගලයෙකු අතුරුදහන්වීමක් - ලියන්ගහවෙල පොලිස් වසම.

2024.01.25 වන දින දහවල් කාලයේ ලියන්ගහවෙල පොලිස් වසමේ බඹරගම ප්‍රදේශයේ පිහිටි කිරිදිඇල්ලෙන් වැටී දියේ ගිලී පුද්ගලයෙකු අතුරුදහන්ව ඇති බවට ලියන්ගහවෙල පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ ඇත.

**දියේ ගිලී අතුරුදහන්වූ පුද්ගලයා වයස අවුරුදු 22 ක් කැබිල්වෙල, බණ්ඩාරවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු ඔහුගේ මිතුරන් සිව්දෙනෙකු සමඟ මෙම දිය ඇල්ල නැරඹීමට පැමිණ එම ස්ථානයේ මත්පැන් පානය කර ඇති අතර එම අවස්ථාවේ මොහු දිය ඇල්ලෙන් ඇද වැටී දියේ ගිලී අතුරුදහන්ව ඇත. ලියන්ගහවෙල පොලිසිය නාවික හමුදා කිමිදුම් නිලධාරීන්ගේ සහය ඇතිව අතුරුදහන්වූ පුද්ගලයා සොයා විමර්ශන කටයුතු සිදුකරනු ලබයි.

**06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට – බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය.**

2024.01.25 වන දින දහවල් කාලයේ පමුණුගම පොලිස් වසමේ පුබුදුගම ප්‍රදේශයේදී බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 50 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස් අවුරුදු 39 ක් වන පුබුදුගම, උස්වැටකෙයියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත් උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**07. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට – ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානය.**

2024.01.25 වන දින උදෑසන කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ ස්ටේස්පුර ප්‍රදේශයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 790 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වූ කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි**

ග්‍රෑන්ඩ්පාස් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**08. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට – හෝමාගම පොලිස් ස්ථානය.**

2024.01.25 වන දින දහවල් කාලයේ හෝමාගම පොලිස් වසමේ පිටිපන දකුණ ප්‍රදේශයේදී හෝමාගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 250 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට** ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වූ පිටිපන දකුණ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හෝමාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**09. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට – ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.01.25 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන දුම්රියපොල අසලදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 800 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස් අවුරුදු 24 ක් වන අත්තිඩිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**10. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට – නිකවැරටිය පොලිස් ස්ථානය.**

**2024.01.25** වන දින සවස් කාලයේ නිකවැරටිය පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත නිකවැරටිය පොලිස් වසමේ ඉහලගම ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන දනිකිතව, නිකවැරටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

නිකවැරටිය පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**11. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට – දඹගල්ල පොලිස් ස්ථානය.**

**2024.01.25** වන දින උදෑසන කාලයේ දඹගල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත රිටිගහවත්ත ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන රිටිගහවත්ත, බුද්ධම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

දඹගල්ල පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**12. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට – පල්ලේවෙල පොලිස් ස්ථානය.**

2024.01.25 වන දින සවස් කාලයේ පල්ලේවෙල පොලිස් වසමේ පුගොඩ ප්‍රදේශයේදී පල්ලේවෙල පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර නීති විරෝධී මත්පැන් ලීටර් 67 මිලි ලීටර් 500 (බෝතල් 90) ක් සහ නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා උපකරණද සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වූ පුගොඩ, පල්ලේවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

පල්ලේවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**13. නීති විරෝධී මත්පැන් සහ මත්පැන් පෙරීමට යොදාගන්නා ලද ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට – කටුනායක පොලිස් ස්ථානය.**

**2024.01.25** වන දින උදෑසන කාලයේ කටුනායක පොලිස් වසමේ හිනටියන, කහටඇල ප්‍රදේශයේදී කටුනායක පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර නීති විරෝධී මත්පැන් ලීටර් 135 ක් සහ නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 1512 ක් (බැරල් 08) සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වූ හිනටියන, මීනුවකන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

කටුනායක පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**14. බලපත්‍ර නොමැතිව මැණික් ගැරූ සැකකරුවන් හය දෙනෙකු අත්අඩංගුවට – හැටන් පොලිස් ස්ථානය.**

2024.01.25 වන දින අළුයම් කාලයේ හැටන් පොලිස් වසමේ දික්ඔය, ඩන්බාර් වත්ත ප්‍රදේශයේදී හැටන් පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීම් දෙකක් සිදුකර බලපත්‍ර නොමැතිව මැණික් ගැරූ සැකකරුවන් 06 දෙනෙකු, මැණික් ගැරීමට යොදා ගන්නා ලද භාණ්ඩද සමඟින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 40, 45, 48, 49, 51 හා 55 වයස්වල පසුවන හැටන් සහ දික්ඔය ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

හැටන් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**15. මාරක රිය අනතුරක් - ගලගෙදර පොලිස් වසම.**

2024.01.25 වන දින සවස් කාලයේ ගලගෙදර පොලිස් වසමේ කටුගස්තොට කුරුණෑගල මාර්ගයේ ගලගෙදර පොලිස් ස්ථානය ආසන්නයේදී කටුගස්තොට දෙස සිට කුරුණෑගල දෙසට ධාවනය වූ සහල් පටවාගත් කන්ටේනර් ලොරි රථයක් බෑවුම් මාර්ගයක ධාවන කරමින් සිටියදී, මාර්ගයේ වම්පස කොන්ක්‍රීට් බැම්මක ගැටී ලොරි රථය පෙරළීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ රියදුරු සහ රිය සහයක ගලගෙදර රෝහලට ඇතුලත් කිරීමේදී රිය සහයක මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 33 ක් වන බරනවිලාන්, තෙලිප්පලෙයි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය ගලගෙදර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. තුවාල ලැබූ රියදුරු ගලගෙදර රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබන අතර ගලගෙදර පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**16. මාරක රිය අනතුරක් - මරදන්කඩවල පොලිස් වසම.**

2024.01.25 වන දින සවස් කාලයේ මරදන්කඩවල පොලිස් වසමේ ගනේවල්පොල ගලෙන්බිඳුණුවැව මාර්ගයේ කඳුබොඩ ප්‍රදේශයේදී ගනේවල්පොල සිට ගලෙන්බිඳුණුවැව දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් මාර්ගයෙන් ඉවතට පැන මීටර් 08 ක් පමණ ඉදිරියට ඇදී ගොස් ඇළ මාර්ගය ආසන්නයේ තිබූ කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ත්‍රීරෝද රථයේ රියදුරු කැකිරාව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 65 ක් වන උත්තුපිටිය, මුරියාකඩවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුර සිදුවන අවස්ථාවේදී මරණකරු පමණක් ත්‍රීරෝද රථයේ ගමන් කර ඇත. බාහිරින් පෙනෙන තුවාල කිසිවක් නොමැති අතර මොහු හෘද රෝගයට ප්‍රතිකාර ලබමින් සිට ඇති බවට සිදුකල විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය කැකිරාව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මරදන්කඩවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**17. මාරක රිය අනතුරක් - පුදුකුඩිඉරිප්පු පොලිස් වසම.**

2024.01.25 වන දින රාත්‍රී කාලයේ පුදුකුඩිඉරිප්පු පොලිස් වසමේ මුලතිව් පරන්තන් මාර්ගයේ සුභන්දිරම්පුරම් කොලනිය ප්‍ර දේශයේදී සුභන්දිරම්පුරම් කොළනිය දෙස සිට වෙල්ලප්පම් හංදිය දෙසට ධාවනය වූ ඩිමෝ බට්ටා වර්ගයේ ලොරි රථයක් ඊට ප්‍රතිවිරුද්ධ දිශාවෙන් පැමිණි ට්‍රැක්ටර් රථයක ටේරලයෙහි පටවා තිබූ කොළ මඩින යන්ත්‍රයක ඉදිරි දකුණු පස ඇති උල සහිත කුල්ල කොටසේ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ට්‍රැක්ටර් රථයේ රියදුරු හා ලොරි රථයේ රියදුරු පුදුකුඩිඉරිප්පු රෝහලට ඇතුලත් කිරිමේදී ලොරි රථයේ රියදුරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 28 ක් වන දේවීපුරම්, පුදුකුඩිඉරිප්පු ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පුදුකුඩිඉරිප්පු රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. තුවාල ලැබූ ට්‍රැක්ටර් රථයේ රියදුරු පුදුකුඩිඉරිප්පු රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබයි. පුදුකුඩිඉරිප්පු පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 18. හදිසි ගින්නක් – හැටන් පොලිස් ස්ථානය.

2024.01.25 වන දින සවස් කාලයේ හැටන් පොලිස් වසමේ ස්ට්‍රැත්ඩන් වත්ත තේ කර්මාන්ත ශාලාව පිහිටි ප්‍රදේශයේ අක්කර 03 ක පමණ භූමි කොටසක හදිසි ගින්නක් හටගෙන ඇති බවට හැටන් පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත පොලිස් ස්ථානයේ නිලධාරීන් හා ප්‍රදේශවාසීන් එක්ව ගින්න නිවා දැමීමට කටයුතු කර ඇත.

ගින්න හේතුවෙන් අක්කර 01 ක පමණ තේ පැල සිටුවා තිබූ භූමි ප්‍රදේශයක් හා අක්කර 02 ක පමණ කැලෑ කොටසකට හානි සිදුව ඇති අතර ගින්නට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. හැටන් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.